# යුද ගිනිදැල් තිබුණු රටේ දැන් ආර්ථිකය සංස්කෘතිය යළි ගොඩනැඟෙන පසුබිමක් සැකසිලා

## - ඇමැති මිලින්ද මොරගොඩ

**හෝමාගම සංචාරක, මංජුල හිරිපිටිය, කොට්ටාව විශේෂ, හෝමාගම විශේෂ**



**අධිකරණ ඇමැති මිලින්ද මොරගොඩ මහතා හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි සහ ගොවි සංවර්ධන නිලධාරීන් ඇමතූ අවස්ථාවයි මේ.**

අද රට පවතින්නෙ තීරණාත්මක යුගයක ආරම්භයකයි. දීර්ඝ කාලයක් රටේ පැවැති යුද්ධය නිසා පහළට ඇදවැටුන ආර්ථිකය, සංස්කෘතිය නැවත ගොඩනැඟීමට අවශ්‍ය පසුබිමක් රටේ අද නිර්මාණය වෙමින් පවතිනවා. එය සාර්ථක කරගැනීමට පාර්ලිමේන්තුවට තුනෙන් දෙකක බලයක් අවශ්‍ය බව අධිකරණ ඇමැති මිලින්ද මොරගොඩ මහතා පැවසීය. ඒ මහතා එසේ පැවසුවේ හෝමාගම පිටිපන පිහිටි අමල්යා හොලිඩේ ඊව් හි පැවැති හෝමාගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාමසේවා නිලධාරීන්, සමෘද්ධි සහ ගොවි සංවර්ධන නිලධාරීන් සමග පැවැති සුහද හමුවකදීය.

මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ ඇමැතිවරයා මෙසේද පැවසීය.

වසර තිහක් වැනි කාලයක් රටක ත්‍රස්තවාදයක් පවතින විට රටේ සෑම ක්ෂේත්‍රයක්ම ආපස්සට යාම සිදුවෙනවා. රටේ සාමය බිඳවැටෙනවා. මේ කාලය තුළදී පොලිස් නිලධාරීන් බැටන් පොල්ලේ සිට වී පතස් හය දක්වා පැමිණියා. අද රටේ දේශපාලනයටත් සිදුවී ඇත්තේ බැටන් පොල්ල වී පතස් හය පැමිණීමයි. එවැනි සංස්කෘතියක් රටේ පවතින විට පාර්ලිමේන්තුවටත් පැමිණෙන්නේ එම සංස්කෘතියමයි. ඉන් මේ රට මුදා ගත යුතුයි. ඒ සඳහා සිවිල් සමාජයට විශාල වගකීමක් පැවරෙනවා. සුදුසු පුද්ගලයන් පත්කර එවන බවට විශ්වාසයක් තිබෙනවා.

ශ්‍රී ලංකා ජාතික සංගමයේ මහලේකම් ආර්. ඒ. ඩී. සිරිසේන මහතා - රටක විනයක් ඇති කිරීමට වැරදි ක්‍රියාවල නොයෙදන දේශපාලනඥයන් හා රාජ්‍ය නිලධාරීන් සිටීම අවශ්‍ය වෙනවා. එය නැතිවන සෑම විටම රටේ සෑම ක්ෂේත්‍රයක්ම ඇදවැටෙනවා මිස සංවර්ධනයක් ඇති වන්නේ නැහැ. රටේ විනයගරුක සමාජයක් ඇති කිරීමට ප්‍රථමයෙන් පාර්ලිමේන්තුවෙන් එය ආරම්භ විය යුතුයි. සෑම නායකයෙක්ම තීන්දු තීරණ ගත යුත්තේ රට දෙස බලා මිස පටු - ආකල්පවලට මුල් තැන නොදීමෙනි. එසේ වන විට රටත් සමාජයත් නිවැරදි ස්ථානයක තිබෙනවා.

වයඹ පළාත් සභා මන්ත්‍රී සුදත් චන්ද්‍රසේකර, ඇමැති මිලින්ද ,මාරගොඩ මහතාගේ සම්බන්ධිකරණ ලේකම් තිලක් අබේනායක මහත්වරුද මේ අවස්ථාවට සහභාගි වූහ.